*සියලුම හිමිකම් ඇවිරිණි.*
*All Rights Reserved*

# අවසාන වාර පරීක්ෂණය 2015

# පෙරදිග සංගීතය

**9 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| |
|---|
| නම/ විභාග අංකයඃ |

## I - කොටස

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ෂෞඩව සම්පූර්ණ ජාති රාගයක් වන්නේ,
(1) යමන් (2) භූපාලි (3) භීමපලාශ්‍රී (4) බිලාවල්

02. සර්ගම් ගීතවල විශේෂ ලක්ෂණය වන්නේ,
(1) වචන පමණක් අඩංගු වීම. (2) ස්වර පමණක් යෙදීම.
(3) රාග ලක්ෂණ අඩංගු වීම. (4) තාලයකින් තොරවීම.

03. |නි ස ග | ම ප | ග ම ග | ප ම | මෙම ස්වර පාදය කිසියම් රාගයකට අයත් වේ. එම රාගය තෝරන්න.
(1) භූපාලි (2) යමන් (3) කාෆි (4) භීමපලාශ්‍රී

04. රි ග ප ධ නි යන ස්වර අනුවාදි ස්වර ලෙස යෙදෙන රාගය වන්නේ,
(1) භීමපලාශ්‍රී (2) යමන් (3) භූපාලි (4) කාෆි

05. |1 2 | 1 2 | 1 2 | 1 2 | මෙම මාත්‍රා බෙදීමට සමාන තිත නම්,
(1) මැදුම් තනි තිත (2) මහ තනි තිත (3) දාදරා තාලය (4) සුළු තනි තිත

06. තිත් ක්‍රමයේ අප්‍රාණික ආඝාතය ලෙස දැක්විය හැක්කේ,
(1) සමග්‍රහ (2) තෙයි (3) තිත් (4) බලිය

07. ජන ගී ආශ්‍රිත සරල ගීතයක් නොවන්නේ,
(1) මල්සරා බැල්ම හෙලා (2) ආදරයේ උල්පත වූ අම්මා
(3) සසර වසන තුරු (4) අක්කා නගාලගෙ බොලඳ සිනා

08. |ස ස රි රි | ග රි ස | රි රි ම ම | ප | මෙම ස්වර පාදය මධ්‍ය භාවයෙන් ලියූවිට ලැබෙනුයේ,
(1) ම ම ප ප | ධ ප ම | ප ප නි නි | ස' (2) ම ම ධ ධ | ප ධ ප | ප ප ධ ධ | නි
(3) ම ම ප ප | ධ ප ම | ප ප නි නි | ස' (4) ම ම ප ප | ධ ධ ප | ප ප නි නි | ස'

09. ගැල්, පැල්, පාරු, පතල් යන ගැමි ගී සම්බන්ධයෙන් නිවැරදි කියමන වන්නේ,
(1) ආඝාතාත්මකව ගැයේ (2) දීර්ඝ යති පිහිටා ගායනා කරයි
(3) නාද මාලා සංකීර්ණය (4) සාමූහිකව ගායනා කරයි

10. 'හිස මගෙ දෙදරයි දෙපා රුදා දෙයි' මේ ගී පාදය අයත් නාට්‍ය විශේෂය වන්නේ,
(1) දෙපානෝ (2) බෙරහඬ
(3) රතු හැට්ටකාරී (4) මුහුදු පතුල යට ඉඳලා

- අංක 11 - 15 දක්වා වූ ප්‍රශ්න වලට පහත සඳහන් භාණ්ඩ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| A | | B | | C | |
|---|---|---|---|---|---|
| 1. | හොරණෑව | 1. | ගැටබෙරය | 1. | සිතාරය |
| 2. | ෂහනායි | 2. | තබ්ලාව | 2. | තාම්පුරාව |
| 3. | බටනලාව | 3. | උඩැක්කිය | 3. | එස්රාජය |

11. ඉහත A, B, C යන භාණ්ඩ වර්ග නම් කළ හැකි පිළිවෙල වන්නේ,
(1) සුෂිර, ආතත, ඝන (2) සුෂිර, විතතාතත, තත්
(3) සුෂිර, අවනද්ධ, තත් (4) විතත, ආතත, තත්

12. A1, B1 කොටස් වලට අයත් භාණ්ඩ වර්ග කළ හැක්කේ,
(1) සුෂිර ආතත (2) සුෂිර විතත (3) සුෂිර විතතාතත (4) සුෂිර අවනද්ධ

13. අමීර් ඛුෂ්රු හා සම්බන්ධ භාණ්ඩ 02 ක ඇතුලත් වන්නේ,
(1) A3, B2 (2) B2, C1 (3) C2, B2 (4) A3, C1

14. සමාන ස්වර පිහිටීමක් ඇති භාණ්ඩය යුගලය ඇත්තේ,
(1) B1, B3 (2) A2, A3 (3) C1, C2 (4) C1, C3

15. ප්‍රශස්ති ගායනය සඳහා වඩාත් යෝග්‍ය භාණ්ඩය අයත් වන්නේ,
(1) A1 (2) B3 (3) C3 (4) B2

- **පහත බටහිර ප්‍රස්තාරය ඇසුරෙන් 16 - 18 දක්වා වූ ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

16. 


මෙම ප්‍රස්තාරයේ සඳහන් බටහිර ස්වරය වන්නේ,

(1) ධ (2) නි (3) නි. (4) ග

17. $\frac{3}{4}$ යන Time Signature ට සමාන වන තාලය වන්නේ,

(1) ත්‍රිතාල් (2) කෙහෙර්වා (3) ජප්තාල් (4) දාදරා

18. ට්‍රෙබල් ක්ලෙෆ් හි රේඛා මත පිහිටි ස්වර පිළිවෙලින්,

(1) GABCD (2) EGBDF (3) GBDFA (4) EFGAB

19. වාදකයින් සියළු දෙනාම සංගීත භාණ්ඩ වාදනය කරමින් ගීත ගායනයේ යෙදීම විශේෂ ලක්‍ෂණයක් වන ගායන විශේෂය නම්,

(1) ප්‍රශස්ති (2) භජන් (3) කැලිප්සෝ (4) දේශාභිමානී ගී

20. කෝඩ්ස් (Chords) වාදනය සඳහා යොදා ගනු ලබන ගිටාර් වර්ගය නම්,

(1) රිදම් ගිටාරය (2) ලීඩ් ගිටාරය (3) බේස් ගිටාරය (4) බොක්ස් ගිටාරය

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

(01) i. 'ම' තීව්‍ර වූ රාගයේ මේලය කුමක් ද?
ii. පංචතූර්ය වාදනය සඳහා යොදා ගන්නා භාණ්ඩ 02 ක් නම් කරන්න.
iii. හින්දුස්ථානි පද්ධතියේ එන සරල ශාස්ත්‍රීය ගායන ශෛලියක් නම් කරන්න.
iv. පහතරට බෙරය සඳහා භාවිතා වන වෙනත් නම් 02 ක් ලියා දක්වන්න.
v. ලතා වල්පොල මහත්මිය විසින් ගායනා කළ දේශාභිමානී ගීතයක් සඳහන් කරන්න.
vi. අර්ධ ශෛලිගත නාට්‍යයක් නම් කර එහි නිෂ්පාදකවරයා ලියා දක්වන්න.
vii. ගැමි ගී වල විශේෂ ලක්‍ෂණ 02 ක් සඳහන් කරන්න.
viii. පංචමය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ස්වර හත ගොඩ නඟන්න?
ix. භීමපලාශ්‍රී රාගයට අයත් ස්වර ඛණ්ඩයක් ලියා දක්වන්න.
x. ත්‍රිතාලයේ 0 (ඛලි) ස්ථානයට නියමිත අක්ෂර ලියා දක්වන්න. (අක්ෂර කොටස) (ල.10)

(02) i. සම්පූර්ණ ජාති රාගයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.03)
ii. ඔබ උගත් සම්පූර්ණ ජාති රාගයේ සර්ගමය ලියා දක්වන්න. (ල.03)
iii. යමන් රාගයට අයත් ස්වර අභ්‍යාසයක් ආරෝහණ අවරෝහණ ආකාරයට ගොඩනඟන්න. (ල.04)

(03) i. මුස්ලිම් ආගමික නැඹුරුවක් ඇති හින්දුස්ථානි ගායන ශෛලියක් නම් කර එහි විශේෂ ලක්‍ෂණ පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්න. (ල.03)
ii. ඔබ භජන් ගායන ශෛලියේ කැපී පෙනෙන ගායකයින් දෙදෙනෙක් සඳහන් කරන්න. (ල.02)
iii. ඉහත (i) කොටසට අයත් ගායන ශෛලිය ඇසුරින් සිංහල ගීත බොහොමයක් නිර්මාණය වී ඇත. එම ගීත 02 ක් සඳහන් කර ඉන් එක ගීතයක් ලියා දක්වන්න. (ල.05)

(04) (a) 1 2 | 3 4 5 | 6 7 | 8 9 10 (b) 1 2 3 | 4 5 6
i. ඉහත (a), (b) මාත්‍රා බෙදීම් අනුව නම් කළ හැකි හින්දුස්ථානි තාල පිළිවෙලින් නම් කරන්න. (ල.02)
ii. එම තාල දෙක ප්‍රස්තාර කරන්න. (ල.04)
iii. (a) කොටසට අයත් තාලයට සමාන දේශීය තිත ප්‍රස්තාර කරන්න. (ල.02)
iv. (b) කොටසට අයත් තාලයට ගැයෙන ස්වර ස්ථාපන ගීතයක මුල් පාද 02 ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.02)

(05)
| ස රි ග ම | ප ප ප | ම ප නි ධ | ප ප ප |
| ම ප ම ග | රි රි රි | රි ම ග රි | ස |

i. ඉහත පෙරදිග ස්වර ප්‍රස්තාරය බටහිර සංගීතයට අනුව ප්‍රස්තාර කරන්න. (ල.04)
ii. ඊට අදාළ Time Signature යොදන්න. (ටයිම් සිග්නේචරය) (ල.02)
iii. | ග ම ප | ග ම රි | ස | |
ඉහත පෙරදිග ප්‍රස්තාරය ද බටහිර සංගීතයට අනුව ප්‍රස්තාර කරන්න. එම ප්‍රස්තාර කොටසේ අවසාන විභාග දෙක සඳහා භාවිතා කරන බටහිර සංකේතය කුමක් ද? එම සංකේතය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)